

# 2023

# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක **492**

ආයතනයේ නම - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீடு தொடர்பான எண் 492
மாவட்ட செயலகம் கொழும்பு
இலங்கை நாடாளுமன்றத்தின் பொது கணக்குக் குழுவினால் சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள் தொடர்பாக நிலையியற் கட்டளை 119(4) ன் கீழ் கௌரவ நிறுவனங்களுக்குப் பொறுப்பான அமைச்சரினால் மேற்கொள்ளப்பட்ட அவதானிப்புக்கள் மற்றும் நடவடிக்கைகள் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

**Parliamentary Publication Series No. 492**

**Name of the Institution - District Secretariat – Colombo**

**Submission of Steps and Observation of the Hon. Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Oder No 119(4)**

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද ස්ථාවර නියෝග **119(4)** සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක **452**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ

| රා.ගි.කා. සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මඟපෙන්වීම | ගණන් දීමේ නිලධාරී විසින් ගත් ක්‍රියාමාර්ග | වර්තමාන ප්‍රගතියය |
|---|---|---|
| **පළමු කොටස : 95.00** | | |
| වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණ බව පිළිගනිමි. | අයකර ගැනීමට නොහැකි වූ කල් ඉකුත් වූ ණය ශේෂ ලියා හැරීම සිදුකර ඇත. අනිකුත් හිඟ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කරමි. |
| රැස්කර තිබුණු ආදායම්, සෘජුවම ආදායමට බැර කර හෝ ඒවා තැන්පත් ගිණුමේ රඳවා ගෙන මාසයකට වඩා අඩු කාලයක් ඇතුලත ආදායම් ගිණුමට බැර කර හෝ නොතිබුණි. | ආදායම් රැස්කිරීම හා ගිණුම් ගත කිරීම ඊට අදාළ චක්‍රලේඛ හා උපදෙස් අනුව කටයුතු කරමි. | විශේෂ අධීක්ෂණයෙන් යුතුව චක්‍රලේඛ උපදෙස් සහ මාර්ගෝපදේශ අනුව කටයුතු කරමි. |
| **දෙවැනි කොටස : 83.00** | | |
| දිස්ත්‍රික් නිවාස කමිටුව මාසිකව රැස්වී නොතිබුණි. | 2023 වර්ෂයේදී දිස්ත්‍රික් නිවාස කමිටුව 2023.03.28, 2023.09.22 සහ 2023.10.23 දිනවල රැස්වී තිබුණි. | වර්තමානය වන විට දිස්ත්‍රික් නිවාස කමිටුව චක්‍රලේඛ උපදෙස් අනුව පවත්වනු ලැබේ. |
| දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව මාසිකව රැස් වී නොතිබුණි. | රටේ පැවති ආර්ථික අර්බුදකාරී තත්ත්වය හමුවේ පොහොර හිඟතාවයක් ඇති විය. එය වැළැක්වීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය සහ පොහොර සංවර්ධන දෙපාර්තමේන්තුව ආදී සීමිත ආයතන සම්බන්ධ වී මාර්ගගත ක්‍රමයට පොහොර කමිටු පවත්වා ඇති බව කාරුණිකව දැනුම් දෙමි. | වර්තමානය වන විට වර්ෂයට පොහොර කමිටු දෙක බැගින් පවත්වා ඇත. |

| | | |
|---|---|---|
| දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුව මාසිකව රැස් වී නොතිබුණි. | දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුව 2023 වර්ෂයේදී දෙවරක් රැස්වී ඇත. එම දින 2023.04.10, 2023.11.01 වේ. ඒ අනුව චක්‍රලේඛ උපදෙස් අනුව පවත්වා ඇත. | වර්තමානය වන විට ද චක්‍රලේඛ හා උපදෙස් අනුව දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටු පවත්වනු ඇත. |
| ආයතනයේ පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂනය කිරීමට හෝ ඇගයීමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | 2023 වර්ෂයේ වර්ෂයේදී ආයතනයේ පුරවැසි සේවාලාභී ප්‍රඥාප්තිය සකස්කර මහජනතාව වෙත ප්‍රදර්ශනය කිරීමට කටයුතු කර තිබුනි. එය ක්‍රියාත්මක වීම පිළිබඳව, අධීක්ෂණය කිරීම හෝ ඇගයීමට ලක්කිරීම 2023 වර්ෂයේදී සිදු නොවූ බව පිළිගනිමි. | වර්තමානය වන විට පුරවැසි ප්‍රඥාප්තිය, අධීක්ෂණය කිරීම හා ඇගැයීමට ලක්කිරීම සහ චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කිරීම සිදුකරන බව කාරුණිකව දැනුම් දෙමි. |
| සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 13කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි. | 2023 වර්ෂයේ රටේ පැවති ආර්ථික අර්බුදකාරී තත්ත්වය හමුවේ පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය. එනම් නිරීක්ෂණවල සඳහන් පරිදි ළඟාවිය නොහැකි විය. | 2024 වර්ෂයේ සිට මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් 50% වැඩි පිරිසකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථා ලබා දී ඇත. ඒ අනුව එක් නිලධාරියෙකුට වර්ෂය තුළදී දින දෙකක පුහුණු අවස්ථාවක් ලැබෙන පරිදි පුහුණු කටයුතු සිදු කරනු ලබන බව කාරුණිකව දැනුම් දෙමි. |
| සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. | පෙන්වා ඇති නිරීක්ෂණ පිළිගනිමි | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018(1) අනුව කාර්යසාධන ගිවිසුම් තවදුරටත් අවශ්‍ය නොවන බව දැනුම් දී ඇත. |
| ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය. | කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ තත්ත්වා ගණනය කළ මතයක් ලබාදීය ඇති බව පිළිගනිමි. | කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය පිළිබඳව පිරිසිදු මතයක් ලබා ගැනීමේ අදහසින් යුතුව, විගණන නිරීක්ෂණ හා චක්‍රලේඛ හා මාර්ගෝපදේශ උපදෙස් අනුව කටයුතු කරමි. |
| සමාලෝචිත වර්ෂයේ කාර්ය සාධන ඉලක්ක නියමිත දිනට ඉදිරිපත් කර නොමැත. | පෙන්වා ඇති නිරීක්ෂණ පිළිගනිමි | පෙන්වා ඇති නිරීක්ෂණ අවධානයට ගෙන නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| දිස්ත්‍රික් හා ප්‍රාදේශිය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම් කාර්තුවකට 01 බැගින් රැස් වී නොතිබුණි. | මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු සම්බන්ධව සංවර්ධන නිලධාරියකුගේ පුරප්පාඩු 2023 වර්ෂයේදී පැවතිණි. තවද ආර්ථික අර්බුදකාරී තත්ත්වය | වර්තමානය වන විට දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම් කාර්තුවකට එක බැගින් පවත්වනු ලැබේ. |

| | | |
|---|---|---|
| | තුළ සාමාන්‍ය පරිදි රාජකාරිය ඉටු කිරීමට නොහැකි විය. එමනිසා මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු පැවැත්වීමට නොහැකි විය. | |
| දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව අවම වශයෙන් කාර්තුවකට 01 බැගින් රැස් වී නොතිබුණි. | 2023 වර්ෂයේදී දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව 2023.05.25 සහ 2023.09.22 දින පවත්වා තිබුණි. | පෙන්වා ඇති නිරීක්ෂණ අවධානයට ගෙන නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යවසන කළමණාකරණ පණත අනුව ආපදා කළමණාකරන කමිටු පවත්වා නොතිබුණි. | පෙන්වා ඇති නිරීක්ෂණ පිළිගනිමි. | 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරන පනත අනුව කටයුතු කරනු ඇත. 2026 වර්ෂයේ 2026.04.24 දින පවත්වා ඇත. |
| දිස්ත්‍රික් පරිසර කමිටුව අවම වශයෙන් මාස 02කට වරක් රැස් වී නොතිබුණි. | දිස්ත්‍රික් පරිසර කමිටුව 2023.03.08, 2023.05.24, 2023.07.19, 2023.09.22 හා 2023.11.16 දින පවත්වා ඇත. | පෙන්වා ඇති නිරීක්ෂණ අවධානයට ගෙන නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**ගිනිගේ ප්‍රසන්න ජනක කුමාර,**

**දිස්ත්‍රික් ලේකම්,**

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,**

**කොළඹ.**

ගිනිගේ ප්‍රසන්න ජනක කුමාර
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය

**ජී. ජයවීර,**

**ප්‍රධාන ගණකාධිකාරී,**

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,**

**කොළඹ.**

ජී. ජයවීර
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් / දිසාපති වෙනුවට
කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය.

## ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

## ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2026 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළගා කර ගැනීමට අපේක්ෂා කරමි.

මහාචාර්ය ඒ.එච්.එම්.එච්.අබයරත්න (පා.ම.)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය

මහාචාර්ය ඒ.එච්.එම්.එච්. අබයරත්න
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍ය
නිදහස් චතුරශ්‍රය - කොළඹ 07.